# විශ්වවිද්‍යාල නවක වදය හා සම්බන්ධව ඇති නීතිමය ක්‍රියාමාර්ග
## ( කැලණිය විශ්වවිද්‍යාලය ඇසුරින්)

එච්.ඩී.පී. මධුෂානි[1] ඩබ්.වී.පී.එම්. නයෝමි[2]
ඩී.එම්.එච්. දසනායක[3] එල්.පී.ඩී. පෙරේරා[4]

**සංක්ෂේපය**

පසුගිය දස අවුරුදු කාලය තුළ ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තුළ විවිධ මුහුණුවරින් නවකවදය ක්‍රියාත්මක වී ඇත. මෙම කාල පරිච්ඡේදයන් තුළ නවකවදය විශ්වවිද්‍යාල පද්ධතිය තුළින් මුලිනුපුටා දැමීමට නොහැකි විය. එයට හේතුවක් ලෙස ගත හැකි වනුයේ නවකවදයට ගොදුරු වූ බොහෝ පිරිසක් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් බවට පත් වූ විගසම එම ආභාෂය අනුගමනය කිරීම හා රැඩිකල් දේශපාලන කණ්ඩායම් නවකවදය දේශපාලන ආයුධයක් බවට පත් කරගෙන නවක ශිෂ්‍යයන් පාලනය කිරීමයි. මෙම තත්ත්වයන් මත විශ්වවිද්‍යාල අධ්‍යාපනයට නවකවදය බාධාවක්ද යන්න අධ්‍යයනයේ ප්‍රධාන ගැටලුව වන අතර නවකවදය හා සම්බන්ධව ඇති නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව විශ්වවිද්‍යාල සිසුන්ගේ ඇති දැනුවත්භාවය පරීක්ෂා කිරීම මෙම පර්යේෂණයේ අරමුණයි. නවකවදය ක්‍රියාවලිය මුලිනපුටා දැමීමට ශ්‍රී ලංකා රජය සහ විශ්වවිද්‍යාල කොමිෂන් සභාව මගින් විවිධ නීතී අණපනත් රෙගුලාසි පනවා ඇත. 1998 අංක 20 දරණ පනත ඒ අතර වැදගත් වේ. පනත්වල පවත්නා අඩුපාඩු හා එහි ප්‍රායෝගික භාවිතය නවකවදය මුලිනපුටා දැමීමට බාධාවක් වී ඇත. අධ්‍යයනය සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ සියලු පීඨ නියෝජනය වන පරිදි සිසුන් 100 ක නියැදියක් තෝරා ගන්නා ලදී. එසේම කිරිබත්ගොඩ, පෑලියගොඩ පොලිස් ස්ථානාධිපතිවරුන් සමග කළ සම්මුඛ සාකච්ඡා මගින් ද ප්‍රාථමික දත්ත රැස්කරන ලදී. දත්ත විශ්ලේෂණය සඳහා ප්‍රමාණාත්මක ශිල්ප ක්‍රම යොදාගත් අතර එහිදී හෙළි වූ ප්‍රධාන කරුණක් වූයේ නවකවදය හා සම්බන්ධව ඇති මූලික නීති කිහිපයක් හැරුණු විට බහුතරය පිළිබඳ දැනුවත්භාවයක් නොමැති බවත් පීඨ අතරින් ගත් කළ වැඩි දැනුවත්භාවයක් කලා පීඨ සිසුන් සතු බවත් ය. නවකවදය හා සම්බන්ධව ඇති නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව ඇති දැනුවත්භාවය මත නවකවදය ඇති වීම හෝ නොවීම තීරණය නොවන බව මෙහිදී හෙළි විය. එසේම නවකවද පනතේ ඇති දුර්වලතා නිසා නවකවදය තවදුරටත් ක්‍රියාත්මක වන බව තහවුරු විය. නවකවදයේ වූ දරුණු ප්‍රචණ්ඩ පැතිකඩ නැතිකර දමමින් එය යහපත් ස්වරූපයකින් පවත්වා ගැනීමට නවකවදය හා සම්බන්ධව

[1]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය, pavithrahdm@gmail.com
[2]ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය,wickramasinghe.mahesha@yahoo.com
[3] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය,කැලණිය විශ්වවිද්‍යාලය, harshanidasanayake1991@gmail.com
[4] ශාස්ත්‍රවේදී (විශේෂ) සමාජ සංඛ්‍යානය, කැලණිය විශ්වවිද්‍යාලය, gdinusha.perera@gmail.com

ඇති නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳව ඇති දැනුවත්භාවය යොදා ගැනීම හා නවකවද පනතේ ඇති දුර්වලතා අවම කර සංශෝධනය කිරීම සිදුකළ යුතුය.

**මූඛ්‍ය පද :** ශ්‍රී ලංකා විශ්ව විද්‍යාල, නවකවදය, නවකවදපනත, අධ්‍යාපනය